**ටෙන්ඩර් දැන්වීමයි**

**<u>ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් සේවයට අයෝග්‍ය වාහන විකිණීම</u>**

ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් සේවයට අයෝග්‍ය වාහන විකිණීම සඳහා **2019** වර්ෂයේ සැප්තැම්බර් මස **09** වන දින **1400** පැය දක්වා ශ්‍රීලංකා නාවික හමුදා මූලස්ථානය, තැපැල් පෙට්ටිය **593**, කොළඹ **01** යන ලිපිනයේදී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. ඒ පිළිබඳ විස්තර හා කොන්දේසි පහත සඳහන් පරිදි වේ.

1. විකිණීමට ඇති වාහන එකක් හෝ ඊට වැඩි ගණනකට ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකි අතර, එක් එක් වාහනය සඳහා වෙන වෙනම මිල ගණන් සඳහන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

2. ටෙන්ඩර් ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රු. 500/- ක් හා ආපසු ගෙවනු ලබන පහත සඳහන් පරිදි ඇපකරයන් සෑම වාහනයක් සඳහාම ඉදිරිපත් කළ යුතු අතර, එම මුදල නාවික හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂ මුදල් වෙත මුදලින් ගෙවිය යුතුය. ඒ වෙනුවෙන් නිකුත් කරනු ලබන ලදුපත් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (ගබඩා පාලන), ශ්‍රීලංනානෞ ගැමුණු, වැලිසර, රාගම වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් ලියකියවිලි සතියේ වැඩකරන දිනයන්හිදී 0900 පැයේ සිට 1600 පැය දක්වා 2019 අගෝස්තු මස 18 වන දින සිට 2019 සැප්තැම්බර් මස 09 වන දින තෙක් නිකුත් කරනු ලබන අතර, යම් ගැණුම්කරුවෙකු වෙත ටෙන්ඩරය ප්‍රධානය කිරීමෙන් පසු මිළදී ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ දක්වා ඇති දිනට ඉවත් කර ගැනීමට අපොහොසත් වුවහොත් එම මුදල ආපසු ගෙවනු නොලැබේ.

| | | |
|---|---|---|
| සම්පූර්ණ වාහන සඳහා (සැහැල්ලු සහ බර වාහන) | රු. | 15,000.00 |
| වාහන සුන්බුන් (සැහැල්ලු හා බර වාහන) | රු. | 7,500.00 |
| සම්පූර්ණ අත්ට්‍රැක්ටර් | රු. | 2,000.00 |
| සුන්බුන් අත්ට්‍රැක්ටර් | රු. | 1,000.00 |
| සම්පූර්ණ යතුරු පැදි | රු. | 1,000.00 |
| සුන්බුන යතුරු පැදි | රු. | 500.00 |

3. විකිණීමට ඇති සේවයට අයෝග්‍ය වාහන 2019 අගෝස්තු මස 18 වන දින සිට 2019 සැප්තැම්බර් මස 08 වන දින දක්වා ශ්‍රීලංනානෞ ගැමුණු, වැලිසර, රාගම ශ්‍රී ලංකා නාවික හමුදා විකුණුම් අංගනයේදී 0900 පැය සිට 1600 පැය දක්වා රජයේ වැඩ කරන දිනයන්හිදී පරීක්ෂා කර බැලිය හැකි වන අතර, පැමිණෙන පුද්ගලයින් තම ජාතික හැඳුනම්පත හෝ වලංගු හැඳුනුම්පතක් රැගෙන ආ යුතුය.

4. 2019 සැප්තැම්බර් මස 09 වන දින 1400 පැය වන තෙක් ටෙන්ඩර් පත් භාරගනු ලබන අතර, වේලාව ඉක්මවූ වහාම ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේදී ඉදිරිපත් වූ ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර, වැඩි විස්තර දු.ක. අංක 011-3818070/011-2213375 මගින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය,
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. **593**,
කොළඹ - 01.